ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය

# ඕල්කට් අනුස්මරණ දේශනය 2010

## ‘මතවාදී වෘතාන්ත සමතුලනය කිරීම - ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විදේශයන්හි ප්‍රතිවරණය කිරීමේ අභියෝගය’*

රවිනාථ පණ්ඩුකාභය ආර්‍යසිංහ**

ආනන්ද විද්‍යාලයීය කුලරත්න ශාලාවේදී

2010 නොවැම්බර් 06

** බෙල්ජියමේ, ලක්සම්බර්ගයේ සහ යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා තානාපති

* මෙහි පළකර ඇති අදහස් කථිකයාගේ අදහස් වන අතර අවශ්‍යයෙන්ම ශ්‍රී ලංකා රජයේ ආකල්ප නොවන බව සැලකුව මනාය.

## 1. පෙරවදන

2010 වසරේ ඕල්කට් අනුස්මරණ දේශනය පැවැත්වීම සඳහා ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය මට ආරාධනා කිරීම ඉතාමත් ඉහළ ගෞරවයක් ලෙස මම සළකමි.

අද දින අප අනුස්මරණය කරන කර්නල් හෙන්රි ස්ටීල් ඔල්කට්තුමා 1832 අගොස්තු මස 02 වන දින ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්ජර්සි නුවර උපත ලැබීය. සිවිල් යුධ සමයේ ඇමෙරිකානු යුධ හමුදාවේ සේවය කළ එතුමා, ඉන් පසු ජනමාධ්‍යවේදියෙකු සහ නීතිඥයෙකු ලෙස කටයුතු කළ අතර 1875 වසරේදී ඇමෙරිකාවේ පරමවිඥාර්ථ සමාගම ස්ථාපිත කළේය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එතුමාගේ අවධානය වඩාත් යොමුවූයේ පූජ්‍ය මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් ඇතුළු බෞද්ධ පිරිසක් විසින් පැවත්වූ 'පානදුරා වාදයේ' ඉංග්‍රීසි පිටපතක් කියවීමෙනි. ශතවර්ෂ තුනට වැඩි කාලයක් ශ්‍රී ලංකාවේ බෞද්ධයන් බටහිර අධිරාජ්‍යවාදීන් හමුවේ විඳි දුක්ගැහැට සම්බන්ධයෙන් සිය අවධානය යොමු කළ ඕල්කට්තුමා බ්ලැවැට්ස්කි මැතිණියද සමගින් ශ්‍රී ලංකාවට පැමිණියේය. ඓතිහාසික වාර්තා පෙන්වාදෙන අන්දමට ඔහු ශ්‍රී ලංකාවට පැමිණියේ 1880 මැයි 17 දින ගාලු වරායෙනි. එදින එතුමා විද්‍යානන්ද විහාරයේදී පංච ශීලය සමාදන් විය. චෙන්නායි අඩියාර්හි පරමවිඥාර්ථ ශාඛාවේ ප්‍රධානියා වූ මහාචාර්ය අගර්වාල් පවසන අන්දමට බෞද්ධ විද්වතුන් සමගින් ශ්‍රී ලංකාවේ පැවති තත්ත්වය සමාලෝචනයට බඳුන් කළ එතුමා, 'පරිහාණියට පත්ව පැවති බෞද්ධයන්ගේ සමාජ තත්ත්වය නංවාලීම සඳහා බෞද්ධ අධ්‍යාපනය නැංවීම, ප්‍රචාරය හා සංවිධානය යනාදී තෙවැදෑරුම් මූලෝපායමාර්ගයක්' යෝජනා කළේය.

ඉන්පසුව ඕල්ට්තුමා ථේරවාද බෞද්ධ පුනර්ජීවයකට මුලපිරුවේය. අගර්වාල් පවසන පරිදි එම වකවානුව වන විට බ්‍රිතාන්‍ය යටත්විජිතවාදී ආණ්ඩුව මිෂනාරි පාසල් 805කට සහාය දක්වන විට සහාය දක්වා තිබුණේ බෞද්ධ පාසල් 02 කට පමණි. ආනන්ද විද්‍යාලය පිහිටුවීමට ප්‍රධාන හේතුවක් වූයේද බෞද්ධ ශිෂ්‍යයන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදී මිෂනාරි පාසල් වෙත ඔවුන් ඇදී යාම වැල්කවීමයි.එතුමා සමකාලීන බෞද්ධ නායකයන්වන පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල, අනගාරික ධර්මපාල, සර් ඩී.බී ජයතිලක සමගින් එක්ව සිදුකළ ජාතික මෙහෙය එතුමාගේ මරණය සිදුවූ 1907 පෙබරවාරි 17 වන දිනෙන් පසුවද ඉදිරියටම ගමන් කළ අතර එය නිදහස් අරගලය සඳහා ශ්‍රී ලාංකිකයන්ට අවැසිවූ හික්මීම සහ ධෛර්‍යය සැපයීමටද හේතුවිය.

අද දිනය සඳහා මාතෘකාවක් සෙවීමේදී මාහට එය වර්තමානය හා වඩාත් සාධනීය ලෙස සසැඳෙන්නාවූ මාතෘකාවක්වීම අවශ්‍යවිය. අද දින මාගේ මාතෘකාවය වන 'මතවාදී වෘතාන්ත සමතුලනය කිරීම - ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විදේශයන්හි ප්‍රතිවර්ණය කිරීමේ අභියෝගය' හරහා මම මීට පෙරාතුව මෙම ඕල්කට් අනුස්මරණ දේශනය සිදුකළ විශිෂ්ට ආදි ආනන්දියන් දෙදෙනෙකු විසින් ඇති කර ඇති දිශානතිය ඔස්සේ තවදුරටත් ගමන් කරන අතරම එහිදී මම මෙම සංවාදයේම තවත් පැතිකඩක් වෙත ඔබගේ අවධානය යොමු කිරීමට අදහස් කරමි.

ජ්‍යෙෂ්ඨ නීතිවේදියෙකු වන ගෝමින් දයාසිරි මහතා 2007 වසරේ ඕල්කට් අනුස්මරණ දේශනය[1] පවත්වමින් එල්ටීටීඊ සංවිධානය සිය ඊළාම් සටන තුළ මුහුණදෙන විසංවාදයන් ඉස්මතු කළ අතරම එම විසංවාදයන් හමුවේ එම සංවිධානයේ පරාජය අනිවාර්‍ය කරුණක් බව හෙතෙම පෙන්වා දුන්නේය. රාජ්‍ය ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා 2009 වසරේ ඕල්කට් අනුස්මරණ දේශනය[2] පවත්වමින් එල්ටීටීඊ සංවිධානය පරාජය කළ ආකාරයත් මෙම අර්බුදය හරහා පැන නැගී ඇති වහා විසඳුම් සෙවිය යුතු අනෙකුත් ගැටළු සම්බන්ධයෙනුත් සිය අදහස් දැක්වීය. අද දින මම මගේ දේශනය හරහා උත්සුක වන්නේ ශ්‍රී ලංකාවේ සාමය සහ ආරක්ෂාව ස්ථාපනය කිරීමේ අප ලද මෙම ජයග්‍රහණය ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විදේශයන්හි ප්‍රතිවර්ණය කිරීමෙන් වඩාත් ශක්තිමත් කරන්නේ කෙසේද යන්න සංවාදයට ලක්කිරීමයි.

---

[1] ගෝමින් දයාසිරි - *'සාම ක්‍රියාවලිය- ජාතික සහ ජාත්‍යන්තර ප්‍රතියමානයන්'* 2007 ජනවාරි 18 වන දින ආනන්ද විදුහලේ කුලරත්න ශාලාවේදී පැවති ඕල්කට් අනුස්මරණ දේශනය

[2] ගෝඨාභය රාජපක්ෂ - *'ශ්‍රී ලංකාව මුහුණදෙන්නාවූ අනාගත අභියෝගයන් - ආරක්ෂාව, සමගිසංධානය හා සංවර්ධනය'* - 2009 නොවැම්බර් 14 දින ආනන්ද විදුහලේ කුලරත්න ශාලාවේදී පැවති ඕල්කට් අනුස්මරණ දේශනය

**2. සංදර්භය**

ඉතාමත් සරළ අර්ථයෙන් 'ප්‍රතිරූපය' යන්න ගොඩනැගෙන්නේ 'යථාර්ථයේ'ම පිළිඹිඹුවක් පෙස වුවද නූතන අවධියේ පවත්නා විවිධ ක්‍රමෝපායයන් මාර්ගයෙන් 'ප්‍රතිරූපය'යන්නෙහි සැබෑ පිළිඹිඹුව විකෘතිකර එය දකින්නාට වෙනස් අර්ථයක් ප්‍රස්තුත වන ආකාරයට සකස් කිරීමට හැකි බව ඔබ සියලුදෙනා හොඳින් දන්නා කරුණකි. එනිසා යම් ප්‍රස්තූතයක් සඳහා එක් 'ප්‍රතිරූපයක්' නොව සමගාමී ප්‍රතිරූපයන් කිහිපයක්ම පැවතිය හැක. එසේම මෙම ප්‍රතිරූපයන් රැස අතරින් සමහර ප්‍රතිරූපයන් වඩාත් ප්‍රමුඛව ඉදිරියට දිස්විය හැකිය.

මම මෙම කරුණ අවධාරණයෙන් සඳහන් කරන්නේ අප මේ ගෙවන පශ්චාත් ගැටුම් සමයේ ශ්‍රී ලංකාවේ සාධනීය 'යථාර්ථයක්' පවත්නා නමුදු එයට අනුරූපව විදේශයන්හි ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පවත්නා 'ප්‍රතිරූපයේ' කිසිදු සාධනීය බවක් දැකිය නොහැකි හෙයිනි. විදේශ කටයුතු අමාත්‍ය ජී.එල් පීරිස් මහතා 2010 ඔක්තෝම්බර් මස 27 වන දින ක්‍රමෝපාය අධ්‍යයනය සඳහා වන කලාපීය මධ්‍යස්ථානයේ දේශනයක් පවත්වමින් 'ගැටුම් අවසන්වීමෙන් පසු ශ්‍රී ලංකාව අත්කරගෙන ඇති ධනාත්මක ප්‍රගතිය ලෝකය විසින් ප්‍රමාණවත් ලෙස හඳුනාගෙන නැත.... මෙය සිදුව ඇත්තේ අහම්බයකින් නොව හොඳින් සැකසූ ප්‍රතිපත්ති ව්‍යුහයන් හරහාය' යනුවෙන් මෙම කරුණ තවදුරටත් අවධාරණය කළේය.

මෙනයින් ශ්‍රී ලංකාව ත්‍රස්තවාදී ව්‍යසනයෙන් මිදී සාමයේ එල නෙලීමට හැකිව ඇති මේ මොහොතේදී ශ්‍රී ලංකාවේ පවත්නා සැබෑ යථාර්ථයන් පිළිබිඹු කරන්නාවූ 'ප්‍රතිරූපයක්' විදේශයන්හි නිර්මාණය කිරීම අප විසින් මුහුණ දිය යුතු මීලග අභියෝගාත්මක ව්‍යායාමයයි. මෙහි අර්ථය ශ්‍රී ලංකාව ගැටළු අර්බුද වලින් තොරවූවක්ය යන සරළ නිගමනය නොව කුමන ආකාරයේ අර්බුදය තිබුණද, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ප්‍රතිරූපය වඩාත් යථාර්ථයට සමීප මෙන්ම සමබර වූවක් විය යුතුබවයි.

***එම හේතුවෙන් අද දින මම පවත්වන දේශනය තුළින් විදේශයන්හි ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය සකස් කරන්නන්ගේ පෙළෙඹවීම් මෙන්ම ඔවුනගේ දුර්වලතාවයන්ද සම්පිණ්ඩනය කර දැක්වීමට බලාපොරොත්තු වෙමි. එසේම අප සියලුදෙනාම නිල මට්ටමින් සහ පොදුවේ මෙසේ ඉදිරිපත්වන නොයෙකුත් මතවාදී වෘතාන්ත සමතුලනය කිරීම සඳහා කටයුතු කළ යුත්තේ කෙසේද යන්න සම්බන්ධයෙන් අදහස් කිහිපයක්ද ඉදිරිපත් කිරීමට අදහස් කරමි. මේ අතරට සැබෑ අව්‍යතාවයන් ආමන්ත්‍රණය කිරීම,විදේශයන්ගෙන් නැගෙන අසත්‍ය කරුණු නිෂේධ කිරීම, අභ්‍යන්තර වශයෙන් අප එකග නොවන කරුණු වෙන් කර ගැනීම සහ එම විසම්මතින් දුරුකර ගැනීම සඳහා වඩාත් වෙහෙසවීම ආදිය සම්බන්ධයෙන් මම විශේෂ අවධානයක් යොමු කරමි.***

ශ්‍රී ලංකාව නැවතත් සිය ප්‍රතිරූපය ප්‍රතිවරණය කිරීම සම්බන්ධයෙන් මම ඉදිරිපත් කරන්නාවූ මෙම කරුණු එය සම්බන්ධයෙන් වන එක් දෘෂ්ටි කෝණයක් පමණක් බව මම දිනිමි. මෙය කෙරෙහි විවිධ පුද්ලයින් විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් අදහස් දැක්විය හැකි අතර, එහිදී පැනනගින්නාවූ මතවාදී විවිධත්වය සම්බන්ධයෙන්ද සමතුලනයක් ඇති කළ යුතු වන්නේ සාධාරණ ගුණදෙස් විචාරයක් ඇති කිරීම සඳහා ය. මගේ මෙම කරුණු දැක්වීම සමගින් මේ පුළුල් මාතෘකාව සම්බන්ධයෙන් යම් ආකාරයක විෂය නිශ්‍රිත ක්‍රියාදමයක් - සංවාදයක් ආරම්භවන්නේ නම් එය ශ්‍රී ලංකාවේම යහපත සඳහාම වන බව මගේ අවංක හැඟීමයි.

**3. විදේශයන්හි ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නිර්මාණය කරනු ලබන බලවේග**

වඩාත් පුළුල්ව බලන කළ විදේශයන්හි ශ්‍රී ලංකාවේ ප්‍රතිරූප සාධනයේ ලා බලපාන බලවේග පහක් පැහැදිළිව හඳුනාගත හැකිය. ඉන් පළමුවැන්න බටහිර රාජ්‍යයන්ය. දෙවැන්න බටහිර රාජ්‍යන්ගේ තීරණ ගැනීමේ ක්‍රමවේදයට සෘජුවම මැදිහත්වන රාජ්‍ය නොවන සංවිධානයි. තෙවැන්න බටහිර රාජ්‍යයන්හි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවයි. සිව්වැන්න මා පුළුල් අර්ථයෙන් 'දැනුවත් මතධාරීන්' යනුවෙන් හඳුන්වන ලංකාවට පැමිණෙන වෘත්තිකයන්, ව්‍යාපාරිකයන්, ව්‍යවසායකයන් සහ සංචාරකයන් යනාදී පිරිසයි. පස්වැන්න ජාත්‍යන්තර ජනමාධ්‍යයයි.

මෙම පස්වැදෑරුම් බලවේග විවිධාකාරයේ මතවාදී වෘතාන්ත ඉදිරිපත් කරන අතර පසුගිය තිස් වසර තුළ ශ්‍රී ලංකාවේ පැවති අනුක්‍රමණික රජයයන් සියල්ලටම තමන්ගේ මතවාදී වෘතාන්තය ස්ඵුට කිරීම සඳහා මොවුන් සමගින් ඉමහත් තරඟයක යෙදමට සිදුවිය.

**අ) බටහිර රාජ්‍ය**

මම බටහිර රාජ්‍යයන් අනෙකුත් රාජ්‍යයන්ගෙන් වෙන් කිරීම සාධාරණීකරණය කරන්නේ ඔවුන්ගේ කටයුතු සම්බන්ධයෙන් මාධ්‍යයන්ගේ ඇස නොමඳව යොමුවීමත්, එමගින් ඔවුන්ගේ ක්‍රියාදමය ප්‍රතිරූප සාධනය සඳහා සෘජුව සම්බන්ධවීමත් නිසා පමණක් නොව, ඔවුන් අනෙකුත් රාජ්‍යයන්මෙන් නොව ශ්‍රී ලංකාවේ යථා තත්ත්වය සම්බන්ධයෙන් පැහැදිළි අවබෝධයකින්ද පසුනොවන බැවිනි.

වර්තමානයේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බටහිරින් නැගෙන විවේචනයන්ට පාදකවී ඇත්තේ රජය හා එල්ටීටීඊය අතර පැවති සටන් වල 'අවසාන අදියර' බව ඔවුන්ගේම තර්කයකි. එනමුත් සැබැවින්ම එයට ඊටත් වඩා අතීතයක් ඇත.බටහිර රටවල් අතර ශ්‍රී ලංකා රජය එල්ටීටීඊ ගැටළුව සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් මෙම අර්බුදය ඇරඹි වකවානුවේ සිටම මතවාදී අසම්මතීන් පැවතුණි. බොහෝ බටහිර රාජ්‍යන් දැරූ මතය වූයේ මෙම අර්බුදය සඳහා යුධමය විසඳුමක් නොමැති බවත් එල්ටීටීඊය සමගින් සාකච්ඡා මාර්ගයෙන් මෙය විසඳාගතයුතු බවත්ය. සමහරෙක් එල්ටීටීඊය පරාජය කළ නොහැකි බලවේගයක් වන හෙයින් රජය ඔවුන් සමග සටන් කිරීම අත්හල යුතුබව සෘජුව පැවසූහ. තවත් සමහරෙක් උත්සුකවූයේ මෙම අර්බුදය තුළ තමාටද ඉස්මතු විය හැකි යම් භූමිකාවක් සකස් කර ගැනීමටයි.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා තමාට පෙරාතුව ජනාධිපති පදවිය දැරූ ජනාධිපති-ජනාධිපතිනියන් සිව්දෙනෙකු එල්ටීටීඊය සමගින් සාකච්ඡා කිරීම සහ ඔවුන් සමගින් සටන් කිරීම සම්බන්ධයෙන් ලත් අත්දැකීම් වලින් යුතු පුද්ගලයෙකුසේම ජනාධිපතිපදවියට පත්වූ මුල් 2005-2006 වසර තුළ එල්ටීටීඊය සමගින් සාකච්ඡා පැවැත්වීම සඳහාද කැපවූ පුද්ගලයෙකි. එනමුත් එල්ටීටීඊය එය නොතකූ විට ඔවුන් පරාජය කළ නොහැක යනුවෙන්වූ මතවාදය හුදෙක් හිතලුවක් පමණක් බව ඔහු ඔප්පුකර පෙන්වීය.

අද දින වන විට මීට කළකට පෙර සමහරක් බටහිර රාජ්‍යයන් ශ්‍රී ලංකා රජයෙන් දැඩිව ඉල්ලා සිටි ඉල්ලීම් අර්බුදය අවසන්වී මාස 18කටත් නොඅඩු කාලයකදී ඉටු කිරීමට ශ්‍රී ලංකාව සමත්වී ඇත. මේ අතර සියළු ළමා සොල්දදුවන් නිදහස් කිරීම, අභ්‍යන්තරික වශයෙන් අවතැන්වූවන් 90% නැවතත් පදිංචිව කිරීම, එල්ටීටීඊ සටන්කරුවන්ගෙන් තුනෙන් එකක් පමණ  ප්‍රමාණයක් නැවතත් සමාජගත කිරීම, ජීවනෝපාය ස්ථාපිත කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය, ප්‍රජාතන්ත්‍රවාදය සුරකිමින් උතුරු සහ නැගෙනහිර පලාත්වල මැතිවරණ යලිත් පැවැත්වීම ආදිය වෙති. එනමුත් මෙවන් සංවර්ධනයන් සම්බන්ධයෙන් කිසිදු තැකීමකින් තොරව තවදුරටත් බටහිර රාජ්‍යයන් ශ්‍රී ලංකාව මත නොයෙකුත් ආකාරයේ පීඩනයන් ඇති කිරීම කිසිසේත්ම සාධාරණීකරණය කළ නොහැකිය. එසේම සමහරක් බටහිර රජ්‍යයන් කිසිදු ධනාත්මක අරමුණකින් තොරව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙන්ම ශ්‍රී ලංකාවේ තත්ත්වය සම්බන්ධයෙන් ඔවුහු සිදුකරන්නාවූ තක්සේරු කිරීම් සඳහා ශ්‍රී ලංකාවට එරෙහිව යම් ආකාරයක පෞද්ගලික මතිමතාන්තර වලින් මිරිකුණු රාජ්‍ය නොවන සංවිධාන සහ මාධ්‍ය ආයතන වැනි පාර්ශ්වයන් සපයන්නාවූ විස්තර තොරතුරු මෙන්ම එල්ටීටීඊ හිතවාදී විදේශයන්හි වෙසෙන දමිළ ප්‍රජාව සපයන්නාවූ තොරතුරු මත පමණක් යැපීම පිළිගත හැකි තත්ත්වයන් නොවේ.

එසේම ශ්‍රී ලංකාව 'ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයක් වශයෙන් ත්‍රස්තවාදය පරාජය කිරීමට දැරූ උත්සාහය' වෙනත් රාජ්‍යයන් සිදුකරන්නාවූ මානුෂවාදී මෙහෙයුම් වලින් දුරස්වූවක් නොවූවද ත්‍රස්තවාදය මර්ධනය කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර ලෙස පොදු ප්‍රමිතියක් නොවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රවේශය සම්බන්ධයෙන්ද විවිධාකාරයේ  සංකීර්ණ මතවාදී ප්‍රවෘත්තීන් ගොඩනැංවීමට හේතුවක් වූ බව පැහැදිළිය. එනමුත් මෙහි උත්ප්‍රාසාත්මක සිදුවීම වන්නේ එවන් මානුෂීය මෙහෙයුම් තුළ සිදුවූ අමානුෂීය ක්‍රියාසම්බන්ධයෙන් අපමණ සාක්ෂි තිබෙන අවස්ථාවක ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්

ප්‍රවෘත්තීන් තුළින් මැවූ චෝදනාවන් සඳහා කිසිදු පිළිගත හැකි සාක්ෂියක් තවමත් ඉදිරිපත් නොවීමයි.

**ආ) රාජ්‍ය නොවන සංවිධාන**

විදේශීය සහ විදෙස් මත මූල්‍යමය වශයෙන් යැපෙන රාජ්‍ය නොවන සංවිධාන බටහිර තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා දැඩි බලපෑමක් සිදු කළ හැකි පාර්ශ්වයකි. ශ්‍රී ලංකාවේ දෘෂ්ටිකෝණයෙන් සෑම රාජ්‍ය නොවන සංවිධානක්ම එකම මිම්මෙන් මැනීම යුක්ති සහගත නොවේ. 2004 වසරේ ඇතිවූ සුනාමි ව්‍යසනයේදීද ගැටුම් පැවති වකවානුවේ මෙන්ම ඉන් අනතුරුවද සමහරක් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ඉතාමත් වැදගත් කාර්‍යභාරයක් ඉටු කළහ.

එනමුත් එම කාර්යභාරය අතරමගදී තවත් සමහර ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ශ්‍රී ලංකාවේ සිට මෙන්ම විදේශයන්ගේ සිටද ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් යම් යම් ප්‍රකාශ නිකුත් කිරීම කෙතරම් සාධාරණද යන්න සිතා බැලිය යුතුය. මෙයින් ප්‍රකටව ගම්‍යවූ කරුණාවූයේ ඔවුන් සිදුකර ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රගමනයට සැබෑ ලෙස දායක වීමක් නොව ශ්‍රී ලංකාවේ අර්බුදය තවතවත් ගැටළු සහගත බවකට පෙරළීම බවයි.

මෑතකදී ප්‍රමුඛ ජාත්‍යන්තර සංවිධාන ත්‍රිත්වයක් වන හියුමන් රයිට් වොච් සංවිධානය, ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය සහ ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෲප් යන සංවිධාන 'උගත් පාඩම් හා ප්‍රතිසංධාන ජනාධිපති කොමිසම' ඉදිරියේ සිය සාක්ෂි ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හරහා පෙනී යන්නේ මෙවන් සංවිධානයන් තමන් ඉදිරිපත් කරන්නාවූ කරුණු වඩාත් පුළුල් සමීක්ෂණයකට භාජනය කිරීමට වඩා දුරක සිට චෝදනා ඉදිරිපත් කිරීමට වඩාත් යුහුසුළු වන බවයි. මෙම 'උගත් පාඩම් හා ප්‍රතිසංධාන ජනාධිපති කොමිසම'2010 මැයි මස 15 වන දින දේශීය වශයෙන් ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබුවේ යුක්තිය පසිඳලීම සඳහා මෙන්ම දශක ගණනාවක් පැවති අර්බුදය හරහා උද්ගතවූ මානව හා භාවාත්මක ගැටළු ආමන්ත්‍රණය කිරීමත් තිරසාර සමගිසංධානයක් ඇති කිරීමත් අරමුණු කරගනිමිනි. රජයේ මෙම පියවර ඉතාමත් පුළුල් ලෙස දේශීය සහ ජාත්‍යන්තර ලෙස පිළිගත් බවද මෙහිදී සඳහන් කළ යුතුය.

හියුමන් රයිට් වොච් සංවිධානය, ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය සහ ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෲප් යන සංවිධාන සංධානගතව ලියූ ලිපියට ජාත්‍යන්තරව පුළුල් ප්‍රචාරයක් ලැබුනු නමුත් ඒ සම්බන්ධයෙන් 'උගත් පාඩම් හා ප්‍රතිසංධාන ජනාධිපති කොමිසම' සහ විදේශ කටයුතු අමාත්‍යාංශය ලියූ ලිපියට ලැබුනේ මඳ අවධානයකි. එසේම මෙම කොමිසම විසින් පළ කරනු ලැබ ඇති අතුරු වාර්තාවෙහි සඳහන් අත්අඩංගුවේ සිටින පිරිස් සම්බන්ධයෙන්, ගැටුම් පැවති ප්‍රදේශයන්හි පෞද්ගලික ඉඩම් සම්බන්ධයෙන්, නීතිවිරෝධී ලෙස ආයුධ භාවිතාකරන්නාවූ පිරිස් සම්බන්ධයෙන්, සිය මව්භාෂාවෙන් කටයුතු කරගෙන යාමට ඉඩදීම සම්බන්ධයෙන්, ජීවනෝපාය මාර්ග සැකසීම සම්බන්ධයෙන් මෙන්ම රජය පිහිටුවා ඇති අන්තර්-කාර්‍යංශ උපදේශක කණ්ඩායම සම්බන්ධයෙන්ද ප්‍රචාරයක් ලැබී නැත.

මෙයින් කෙනෙකුවෙත ලැබෙන ආකල්පය නම් රජ්‍ය නොවන සංවිධානයන් විසින් වඩාත් යුහුසුළුව උළුප්පා දක්වන්නේ මෙරට සම්බන්ධයෙන් වන ඍණාත්මක කරුණු පමණක් බවයි. ඔවුන්ගේ දෑස් ඉදිරියේම සිදුවන ධනාත්මක වර්ධනයන් වෙත ඔවුන් අන්ධයන් සේ ක්‍රියා කිරීම කණගාටුවට කරුණකි. මෙවන් තත්ත්වයක් හමුවේ ඔවුන් කෙතරම් විශ්වාසනීය පිරිසක්ද යන්න සම්බන්ධයෙන්ද අපගේ සිතෙහි ඇතිවන්නේ සැකයකි.

**ඇ) විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයෝ**

මිලියන 20 පමණ වන ශ්‍රී ලාංකීය ජනතාවගෙන් 15% පමණ එනම් මිලියනයක් පමණ විදේශයන්හි ජීවත්ව අතරම මොවුන්ගෙන් බහුතරය ප්‍රධාන වශයෙන් මැදපෙරදිග කේන්ද්‍රකරගෙන ලෝකය පුරා විසිරී සිටින්නාවූ සේවා සපයන්නන් පිරිසකි. ඉතිරි පිරිස බටහිර සහ ඔස්ට්‍රේලියාවේ සහ

නවසීලන්තයේ පදිංචිව සිටින ශ්‍රී ලාංකිකයෝය. මේ අතරින් දමිළ ජාතිකයන්ගේ ප්‍රමාණය මිලියනයක් පමණ වෙයි. මොවුන්ගෙන් බහුතරය සරණාගත රැකවරණ පතන්නෝය. මෙම පිරිසෙහි ඇති සුවිශේෂී ලක්ෂණය වනන්නේ ඔවුන් සතුව ඡන්ද එකමුතුවක් පැවතීම සහ එය හේතුවෙන් යම් යම් දේශපාලනික වාසි ලබා ගැනීමේ හැකියාවක්ද ඔවුන් සතුව පැවතීමයි.

මෙම දමිළ ප්‍රජාව සතුව ඇති මෙම බලපෑම් සිදුකළ හැකි හැකියාව අධිතක්සේරුවකට ලක් නොකළ යුතු අතරම එය බොහෝ සුළු කොට තැකිය යුතුද නැත. බටහිර රාජ්‍යයන්වල මෙම ප්‍රජාවගේ ක්‍රියාකාරකම් ආරම්භවූයේ එල්ටීටීඊය දමිළ බෙදම්වාදී අරගලයේ තනි උරුමක්කාරයින්වීමට කළකට පෙරය. මෙහිදී මම 1979 මැයි මස 09 වන දින ඇමෙරිකාවේ මැසචුසෙට් රාජ්‍ය සභාව දමිළ ඊළම සඳහා සහයෝගය දැක්වීමට කළ තීරණය සහ 1979 මැයි මස 22 වන දිනය ‘දමිළ ඊළාම් දිනය’ යනුවෙන්ද ප්‍රකාශයට පත්කිරීම යළිත් සිහිකරමි. එසේ ආරම්භවූ ව්‍යාපාරයන් එල්ටීටීඊයේ පරාජයෙන් පසු ක්ෂණිකවම අහෝසි වනු ඇතැයි අප නොසිතිය යුතුය. සබැවින්ම ලෝකයේ දරුණුම ත්‍රාසවාදී සංවිධානයේ සහකරුවන් යන ලාංඡනය තවදුරටත් ඉස්මතු නොවන තත්ත්වයක් තුළ මෙම පිරිස් සිය ක්‍රියාකාරකම් සම්බිධයෙන් නවජීවයක් ලබා ඇති බවද පැවසිය යුතුය. මෙහිදී දමිල තරුණ පිරිස් විසින් ඉටුකරන්නාවූ භූමිකාව වැදගත්ය. ඔවුහු කිසි දිනෙක ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අත්දැකීම් ලබා නැතිමුත් මෙම අවස්ථාව සිය ‘දේශපාලනික’ අරමුණු සඳහා කදිම අවස්ථාවක් යැයි සිතා ක්‍රියාකරන බවක් පෙනේ. මෙය මොවුනට පමණක් සීමාවූ ක්‍රියාකාරකමක් නොව විදේශයන්හි වෙසෙන අනෙකුත් ජනවාර්ගික පිරිස්ද අනුගමනය කරන්නක් බව ඉතිහාසය පෙන්වා දෙයි.

තමාට ලැබී ඇති මෙම ‘නිදහස්’ අවකාශය තුළ ඔවුන් ‘ආස්ථාන’ ගතවී ඇති ආකාරයේ දෙබෙදුමක් දැකිය හැකිය. උදාහරණ ලෙස විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික දමිල ප්‍රජාවගෙන් බහුතරයක් අන්තවාදී අදහස් අත්හැර තමාගේ අක්-මුල් හා සම්බන්ධවීමට වර්තමානයේ උත්සාහ දරති. ඒ බව ශ්‍රී ලංකාවට පැමිණෙන එවන් පිරිස් ප්‍රමාණයෙන් සහ ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට පෙළඹ ඇති ප්‍රමාණයෙන්ම පැහැදිළි වෙයි. එනමුත් එම ප්‍රජාවගෙන් ඝෝෂාකාරී සුළුතරයක් ශ්‍රී ලංකාව අපකීර්තියට පත් කරමින් ඔවුන ගේ ‘සටන’ තවදුරටත් පවත්වාගෙන යාමටද සූදානම්ව සිටති.

මෙම සටන්කාමී පිරිස් අතරද කවුරුන් ඔවුන’තරින් ප්‍රමුඛයා විය යුතු දැයි යන්න සම්බන්ධයෙන්ද ගැටුම් පවතියි. කරුණු පැහැදිළි වන ආකාරයට මින් එක් කණ්ඩායමක් වන ‘නෙදියවන්’ කණ්ඩායමේ ප්‍රධානියාවන පෙරිම්පනායකම් සිවපරාන් එල්ටීටීඊයේ සහ ප්‍රමුඛ සංවිධානයන්ගේ මුල්‍යමය වත්කම්වල වර්තමාන හිමිකරුවී ඇති අතරම ඔහු සිය කණ්ඩායම සමගින් තවදුරටත් සංවිධානාත්මක සාපරාධී ක්‍රියා, මිනිස් ජාවාරම් සහ අයථා ලෙස උපයාගත් මුදල් විශෝධනය කිරීම ආදී කටයුතු සිදු කරයි. ප්‍රභාකරන් යේසුස් වහන්සේට සමකළ ග්ලෝබල් ටැමිල් ෆෝරම් නායක එමෑනුවෙල් පියතුමා ශ්‍රී ලංකා විරෝධී ප්‍රචාරක කටයුතු සිදුකරන අතරම ‘නදියවන්’ කණ්ඩායමේ නැගී එන ප්‍රධාන චරිතයක්ද වෙයි. මොවුන් අතරින් තෙවන කණ්ඩායම වන ඇමෙරිකාව පදනම් කරගත් නීතිඥයෙකු වන වී.රුද්‍රකුමාරන් ඇතුළු කණ්ඩායම ඊනියා ‘මව්රටින් පිටත පිහිටුවා ඇති ඊළාම් රාජ්‍ය’ට සිය නායකත්වය ලබාදෙන අතරම ‘ දමිළ ඊළම’ දිනාගැනීමේ ක්‍රියාවලියේ දේශපානික-රාජ්‍යතන්ත්‍රීය මෙහෙයුම ක්‍රියාත්මක කරති.

ත්‍රස්තවාදය මේවන විට ශ්‍රී ලංකාවේ අතීත සිහිවටනක් පමණක් වුවද මෙම පශ්චාත් ගැටුම් අවධියේදී ශ්‍රී ලංකා රජයට වඩාත්ම ප්‍රබල අභියෝගය ඉදිරිපත්කරන්නේද මෙම පිරිසයි. ශ්‍රී ලංකාව සාමාන්‍ය තත්ත්වයට පරිවර්තනයවීම හේතුවෙන් වර්තමානයේ පිටුවහල් කිරීමට ලක්වී සිටින බටහිර රාජ්‍යයන්ට නීති විරෝධීලෙස ඇතුල්වී සිටින සරණාගත පිරිස් පිටුවහල් කිරීම වැලැක්වීමට කරුණු ඉදිරිපත් කිරීමටද මෙම පිරිස් ඉදිරිපත් වෙති.

**ඈ)අනෙකුත් දැනුවත් මතවාදීන්**

මා පෙර සඳහන් කළ පරිදි 'අනෙකුත් දැනුවත් මතවාදීන්' යන කණ්ඩායම තුළ ජාත්‍යන්තර ආයතන, ආයෝජකයින්, සංචාරකයින්, විද්වතුන් ආදී පිරිසක් සිටිති. මෙම පිරිස් ශ්‍රී ලංකාව සමගින් සමීපව කටයුතු කිරීම හරහා විදේශයන්හි ශ්‍රී ලංකාවේ ප්‍රතිරූප සාධනය සඳහා සම්බන්ධවී ඇති අතරම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිරූපයක් ගොඩනැංවීමට වඩාත්ම බලපෑමක් සිදුකළ හැකි කණ්ඩායමක්ද වෙති. මෙම පිරිස හට ශ්‍රී ලංකාවට බාහිරින් ගොඩනැගෙන ඇති පීඩනයන්ගෙන් මෙන්ම රටෙහි අභ්‍යන්තර සමාජය බෙදවෙන්කර ඇති පක්ෂ දේශපාලනයෙන්ද බැහැරවීමේ හැකියාවක් ඇත.

ශ්‍රී ලංකාව සම්බන්ධවෙන් කරුණු අධ්‍යයනය සඳහා ඔවුන් යොදගන්නේ වඩාත් යථාර්ථවාදී දර්ශකයන්ය. ඔවුහු දැනටත් බොහෝ ශ්‍රී ලාංකිකයන්හට අමතකවී ඇති කරුණක් නිරන්තරයෙන් අගය කරති. එනම් 2009 මැයි 18 වන දිනෙන් මතු ත්‍රස්ත මර්ධනයේ නාමයෙන් කිසිදු උණ්ඩයක් ශ්‍රී ලංකාවේ පත්තු කර නොමැති බවයි. එදින සිට සැමකෙකුටම මුළු දිවයින පුරාම සංචාරය කළ හැකි බවත්, මුළු දිවයිනම දේශපාලනි ස්ථාවර භාවයක්, යටිතළ පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වයක් ලබාදී ඇති බවත්, ආර්ථිකය 8.5%ක වේගයකින් සංවර්ධනය වන බවත්, විදේශ සංචිත ඉහළ මට්ටමක පවතින බවත්, 2010 වසරේ ආසියාවේ විශිෂ්ටතම කොටස් වෙළෙඳපල පවතින්නේ ශ්‍රී ලංකාවේ බවත්, ශ්‍රී ලංකාවේ යුධ අවදානමක් නොපවතින බවත්,ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ගේ ප්‍රමාණය 44% ඉහළගොස් ඇතිබවත් නිරන්තරයෙන් ලෝකය වෙත ගෙනයන්නේ මොවුහුය.

**ඉ)ජාත්‍යන්තර මාධ්‍ය**

ධනාත්මක ප්‍රවෘත්තියක් ප්‍රවෘත්තියක් නොවන බවත් මේ නිසාම සමහර ප්‍රවෘත්ති ආයතන විශේෂයෙන්ම සංවර්ධනය වන රටවල් සම්බන්ධයෙන් ඍණාත්මක පුවත් වඩාත් උළුප්පා පෙන්වන බවත් අප දන්නා කරුණකි. එසේම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර මාධ්‍යයන්හි දේශපාලන පිටු ඍණාත්මක කරුණු වලින් පිරවීම සිදුවන්නේද අනවශ්‍ය අන්දමිනි.

විශේයෙන්ම වර්තමානයේදී ශ්‍රී ලංකාව ගැටුම් සම්බන්ධයෙන් පුවත්පත්වල ශීර්ෂපාඨ වලින් ඉවත්වී ඇති මොහොතක කොළඹ පදනම්වූ විදේශ ජනමාධ්‍යවේදීන් තමන්ගේ ප්‍රවෘත්ති මූලාශ්‍ර ලෙස දේශීය මාධ්‍යයන්හි පළවන වාර්තා යොදාගනිති. එකම සිදුවීම දේශීය මාධ්‍ය හරහා කෙතරම් විපරීත ආකාරයෙන් වාර්තාවන්නේද යන්න ඔබ සැම දනිති. එවන් විපරීත වාර්තා පදනම් කරගෙන විදේශ ජනමාධ්‍යවේදීන් සකසන වාර්තා කෙනෙකුට සිතාගත නොහැකි තරම් විපරීතවිය හැකිය. ඉදින් මේවා කියවන විදේශයන්හි සිටින පිරිස්ගේ හිස්මොල විපරීතවීමද වැලැක්විය නොහැකිය. ශ්‍රී ලාංකිකයන් මෙම වාර්තා කියවන්නේ එහි පසුබිම පිළිබඳ අවබෝධයකිනි. එනමුදු විදේශයන්හි සිටින පිරිස් හට එවන් පසුබිම් අවබෝධයක් නොමැත. ඔවුන් තේරුම්ගන්නේ ශීර්ෂපාඨයේ සඳහන්වන නිගමනයයි. 'කෙන්ද කන්ද' කර පෙන්වීමට මේ පිරිස් බොහෝ සමතුන්ය. විටින් විට සිදුවන මිනීමැරුමක්, උසාවි තීන්දුවක්, වෘත්තීය සමිතියක් සිදුකරන වැඩවර්ජනයක්, පිටත ලෝකයට ගෙනයන්ගේ මුළු රටේම මහා කලබගෑනියක් සිදුව ඇති බවක් හඟවමිනි. ආර්ථික කරුණු සම්බන්ධයෙන් පළවන ලිපි කිහිපයකින් හැර පසුගිය වසර දෙකක කාලය තුළ ශ්‍රී ලංකාවේ සිදුවී ඇති ප්‍රගතිය නිසි ආකාරයකින් ලොවට හෙළිවී නොමැත. කෙටියෙන් පවසතොත් විදේශයන්හි මවා ඇති ශ්‍රී ලංකාව සැබෑ ශ්‍රී ලංකාව නොව වෙනත්ම රටකි.

**4. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විදේශයන්හි ප්‍රතිවරණය කිරීම**

මෙනයින් මෙවන් මතවාදී වෘතාන්ත රැසක් පවතිද්දී ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැවතත් සකස් කිරීම සඳහා ප්‍රමුඛ මතවාදී වෘතාන්තයන් බිම් මට්ටමේ පවත්නා යථාර්ථයන් විශ්වසනීය බවකින් යුතුව ඉස්මතු කිරීම අප ගත යුතු ක්‍රියාමාර්ගයන් මොනවාද?

මෙය සඳහා කුමන ආකාරයෙන් ක්‍රියා කළ යුතුද යන්න සම්බන්ධයෙන් සෘජු පිළිතුරක් මා සතුයැයි ඇඟවීම මගේ අදහස නොවේ. එනමුත් ජනමාධ්‍යවේදියෙකු මෙන්ම, රාජ්‍යතාන්ත්‍රික නිලධාරියෙකු ලෙසත්, සිය මවු රටත් පිටත වෙනත් රටවල ජීවත්වන ජන කණ්ඩායම්වල දේශපාලනය සම්බන්ධයෙන් අධ්‍යනයන් සිදුකරන ශිෂ්‍යයෙකු ලෙසත් ඉහත කරුණ සම්බන්ධයෙන් මාගේ සිතෙහි පැන නගින සිතුවිළි ඔබ සමග බෙදාගැනීමට කැමැත්තෙමි. ප්‍රතිරූපය නැංවීමේ කාර්යයේදී ශ්‍රී ලංකාවේ වර්තමාන අවශ්‍යතාවයන් වෙත වඩාත් අනුරූප වන්නේ කුමක්ද යන්න සම්බන්ධයෙන් අප සියලුදෙනාම සහභාගිවිය යුතු වඩාත් අර්ථාන්විත සංවාදයක් සඳහා මා පවසන මෙම කරුණු ඉවහල් වනු ඇති බව මාගේ හැඟීමයි.

**අ) විදේශයන්හි ක්‍රියාත්මක වන බලවේග සෘජුව ආමන්ත්‍රණය කිරීම**

මෙය අත්කර ගැනීම සඳහා මම පෙර සඳහන් කළ විවිධ කොටස් වෙත විශේෂයෙන් සකස් කළ පණිවුඩ ලබාදීම අවශ්‍යය. මෙම කාර්යයේ ප්‍රාථමික වගකීම පැවරී ඇත්තේ ශ්‍රී ලංකා රජයට බව සත්‍යයකි. එනමුත් මෙම එක් එක් පිරිස් ඇමතීමේදී රජයට අමතරව අනෙකුත් පිරිස් සතුවද වැදගත් වගකීමක් පවතින බවද සැළකිය යුතුය. මෙම අභියෝගයට සාර්ථකව මුහුණදීමට, එනම් විදේශයන් හි ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැංවීම සඳහා, ඔබ - මම -අප යන මේ සියල්ලන්ගේම පොදු දායකත්වය අත්‍යවශ්‍ය සාධකයකි.

**බටහිර රාජ්‍ය**

බටහිර රාජ්‍යන් සම්බන්ධයෙන් සිදු කළ හැක්කේ අප මෙන්ම ආත්ම ගෞරවයෙන් යුතු අනෙකුත් රටවල් සිදුකරන්නාක් මෙන් යම්යම් දුර්වලතාවන් පෙන්වාදෙන අවස්ථාවලදී ඒවා සකසාගැනීමත්, රාජ්‍යක ජාතික අවශ්‍යතාවන්ට අනුරූප නොවන යෝජනා පැන නැගුණු විට ඒවා ප්‍රතික්ෂේප කිරීමත්ය. සමහරෙකුගේ සිතේ පහලවන මනෝමූලික බිය සැක පහ කිරීමට අපට හැකියාවක් නැත. එනමුත් යමෙක් අල්ප හෝ සත්‍යය කරුණක් ඉදිරිපත් කළ හොත් ඒවා විසඳාදීමට 'වැඩි පියවරක්' තැබීමට අප සූදානම් විය යුතුය. හැකිතාක් කාලයක් මොවුන් සමගින් සම්බන්ධවී කටයුතු කිරීමට ශ්‍රී ලංකාව සූදානම් විය යුතු නමුත්, අසාධාරණ ඉල්ලීම් ඉටු කිරීමට තරම් දැඩි පීඩනයකට ශ්‍රී ලංකාව නතුවීම අනවශ්‍යය.

ඒ අතරම පශ්චාත් නන්දිකඩාල් සිදුවීම් පෙළ රජයට මෙන්ම වෙනත් විදේශ රාජ්‍යන්ටද අභියෝගයක් බව අප අවබෝධ කරගැනීම වැදගත්ය. මෙම සිදුවීම් පෙළ සමගින් පැනනැගුණු ප්‍රතිඵලද පැහැදිළිය. එල්ටීටීඊවාදී දමිළ ක්‍රියාකාරීන් සහ ඔවුන්ගේ පෙරමුණු බටහිර රාජ්‍යන්ගේ නීති උකුසු ඇස මගහැරීමට උත්සුක වන නමුත් මෑතකදී ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය, කැනඩාව, ප්‍රංශය, නෙදර්ලන්තය වැනි බටහිර රාජ්‍යයන් ගණනාවක සිදුවූ අත්අඩංගුවට ගැනීම් සහ නඩුතීන්දු වලින් පැහැදිළි වන්නේ මෙවන් පිරිස් එම රාජ්‍යයන්ගේ ජාතික ආරක්ෂාවට කෙතරම් තර්ජනයක් දැයි ඔවුන් වටහා ගෙන ඇති බවයි. වර්තමානයේ පවා වේගයෙන් සිදුවන්නාවූ දමිළ තරුණයින්හට රැඩිකල්වාදී ආකල්ප ලබාදීම සහ 'තමිල් සෝලෙයි' පාසල් පවත්වාගෙන යාම සම්බන්ධයෙන්ද මොවුන් සිය අවධානය යොමුකර ඇත. එනමුත් 'භාෂා පාසැල්' යන උදෘතයට මුවාවී ක්‍රියාත්මක වන මෙවන් පාසැල් සඳහා ආධාර ලබාදෙන්නේද මොවුන්මය. මෙවන් පාසැල්වලින් අධ්‍යාපනය ලැබූ තරුණ පිරිස් පසුගිය වසරේ ලංඩන්, පැරිස් යන නගරයන්හි ශ්‍රී ලංකා විරෝධී පෙළපාලි පැවැත්වූ බවද ඔස්ලෝ නුවර, පැරිසියේ මෙන්ම හේග් නුවර පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයන්ට ඔවුන් පහරදුන් බවද මම ඔබ සැමට මතක්කර දෙමි.එසේම ශ්‍රී ලාංකිකයින් පිරිසක් රැගත් *එම්.වී සන් සී* නෞකාව කැනඩාව වෙත යාමේ සිද්ධියත් බැංකොක් නුවරදී එසේ යාමට සැරසී සිටි 250 පමණ පිරිසක් අත්අඩංගුවට ගැනීමේ සිද්ධියත් වර්තමානයේ සිදුවන මානව ජාවාරම මොනවට පැහැදිළි කරන අතරම එය ශ්‍රී ලාංකික ආර්ථික සංක්‍රමණිකයන් වෙත බටහිර රාජ්‍යයන් දක්වන්නාවූ හොඳහිත කළක් තිස්සේ ඔවුන් අයුතු ප්‍රයෝජන ගන්නා ආකාරයද ඉස්මතු කර පෙන්වන අවස්ථාවකි. මෙසේ බටහිර රාජ්‍යන්ගේ සරණ පතා පැමිණෙන

පිරිස් අතරින් 70% පමණ තමාගේ ගම්බිම් හිතමිතුරන් බැලීම සඳහා වසරක් පාසා ශ්‍රී ලංකාවට පැමිණෙන බවද මෑතකදී කැනඩා රජය මගින් පැවැත්වූ සමීක්ෂණයක් හෙළි කර ඇත.

සමහර රාජ්‍යයන් මෙන්ම ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර සංවිධාන මෙම පිරිස් විසින් සිදුකරන්නාවූ පීඩනයන්ට හසුව සිටින නමුත් වර්තමානයේදී දැකිය හැකි නැඹුරුතාවයන්ගෙන් පෙනී යන්නේ බහුතර රාජ්‍යයන් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් තමාගේ මූලෝපායයන් යළි තක්සේරුවකට භාජනය කරන්නාවූ බවක් හා දේශපාලනික හා ආරක්ෂක අංශයන්ගෙන් ශ්‍රී ලංකාව හා සම්බන්ධතාවයන් ඇති කර ගැනීමට වඩාත් උත්සාහ දරන බවකි. මෙම රාජ්‍යයන්ගේ ප්‍රතිපත්ති සම්පාදකයනගේ මනසේ සැරිසරන සිතුවිල්ල වී ඇත්තේ එල්ටීටීඊ හිතැති දමිළ ප්‍රජාව සහ රාජ්‍ය නොවන සංවිධානයන් සතුටු කිරීම සඳහා මෙතක් කල් ඔවුන් සමගින් කටයුතු කිරීමෙන් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්වූ ඔවුන් සතුව තිබූ යම් ආකාරයක බලය පමණක් නොව අනාගතයේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සිදුවන්නාවූ සංවර්ධනයන්හි කොටස්කරුවන්වීමට ඇති හැකියාව පවා තමාට අහිමි විය හැකි බවකි.

මෙම අවබෝධය හරහා ඔවුන් ශ්‍රී ලංකාව සමගින් පවත්වන්නාවූ සම්බන්ධතාවයන් සම්බන්ධයෙන් අනාගතයේදී සිය මූලෝපායයන් නැවතත් විමර්ශනයකට ලක්කරනු ඇති බවට සැකයක් නොමැත. එලෙඹෙන ජනාධිපති මහින්ද රාජපක්ෂයන්ගේ දෙවන ජනාධිපති ධූර සම්ප්‍රාප්තිය බටහිර රාජ්‍යයන්ට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සිය මූලෝපායන්ගේ අවශ්‍ය වෙනස්කම් සිදුකර වඩාත් ගෞරවාන්විත මෙන්ම ධනාත්මක ලෙස කටයුතු කිරීමට සුදුසු කාලයක් බව මගේ හැඟීමයි.

**ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන**

ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන පශ්චාත් සුනාමි වකවානුවේදී මුහුණපෑ ගැටළු යළිත් මුහුණපා සිටින බවක් පෙනී යයි. එනම් තමා පසුගිය තිස්වසරක් පුරා සිදු කළ කාර්‍යයන් පශ්චාත් ගැටුම් සමයේදී වෙනසකට භාජනය කළ යුතු බවයි. ඔවුන් තවදුරටත් ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන් හා අතරමැදියෙකු ලෙස ක්‍රියා නොකරන අතරම මලමිනී ප්‍රවාහනය නොකරති. වර්තමානයේ ඔවුන්ගේ කාර්‍යභාරය විය යුත්තේ ශ්‍රී ලංකා රජය විසින් සිදුකරන්නාවූ පශ්චාත් ගැටුම් සංවර්ධන කාර්‍යයේ කොටස් කරුවන් වීමයි. මෙහිදී ප්‍රමුඛතාවයක් ගන්නේ නැවත ගොඩනැංවීම සහ සංවර්ධනයයි. මෙම කරුණ අවබෝධකර ගැනීමට නොහැකිවීම හෝ අවබෝධ කරනොගැනීම වර්තමානයේ උද්ගතව පවත්නා අනවබෝධයන්ට සහ අසසමමතීන්ට හේතුවක් වී ඇත.

මෙම සංවිධානයන්ට ලැබෙන්නාවූ ආධාර මුදල් වියලී යන අවස්ථාවක යථාර්ථයට මුහුණදෙනවාටත් වඩා මොවුන් උත්සුකවන්නේ තමන්ගේ පැවැත්ම ආරක්ෂා කර ගැනීමයි. එම හේතුවෙන් ඔවුන් ශ්‍රී ලංකාවේ පවත්නා තත්ත්වයන් අතිශයෝක්තියකින් වාර්තාකරන අතරම එමගින් ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ පැවැත්ම සාධාරණීකරනය කිරීමටද වෙහෙසෙති. එයින් ඔවුන් බලාපොරොත්තුවන්නේ ඔවුන්ගේ පැවැත්ම සඳහා ඉවහල් වන මුදල් ආධාරයි.

මෙම තත්ත්වයට පිළිතුර වන්නේ ශ්‍රී ලංකා රජය රාජ්‍ය නොවන සංවිධාන එකිනෙකාගෙන් වෙන් කර හඳුනාගැනීමයි. එසේම රාජ්‍ය නොවන සංවිධානයන් සහ රාජ්‍ය බලධාරීන් අතර පවත්නා සම්බන්ධය වඩාත් තීව්‍ර කිරීමයි. එසේම රාජ්‍ය නොවන සංවිධානයන් සිය වගකීම් මනාව ඉටුකරන්නේද යන්නත් සොයා බැලීමට රජය උත්සුක විය යුතු අතරම එම සංවිධානද තමාගේ කටයුතු සම්බන්ධයෙන් විනිවිද භාවයෙන් යුතුව කටයුතු කිරීම මගින් දෙපාර්ශ්වය අතර ඇති සම්බන්ධය වඩාත් ශක්තිමත් කළ යුතුය.

**විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව**

පශ්චාත් නන්දිකඩාල් සිදුවීම් වලින් පැහැදිළිවන කරුණක් නම් විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකීය දමිළ ප්‍රජාව තනි හඬක් නොවන බවයි. තවමත් ඔවුන්ගෙන් සුළුතර පිරිසක් එල්ටීටීඊ සිහිනයේ ගැලී සිටින නමුත් බහුතර පිරිසක් අතීත සිදුවීම් අමතක කර දැමීමට සූදනම් අතර, එම සුළුතර

පිරිසට නොබියව එරෙහිවීමටද ඔවුන් උත්සුක වන බවක් පෙනී යයි. එසේම සමහර එල්ටීටීඊ ක්‍රියාකාරීන් ඉන් සම්පූර්ණයෙන්ම ඉවත්වී ප්‍රයෝජනවත් පුරවැසියන් බවට පත්වීමට තීරණය කර ඇති බවත් පැහැදිළිය.

එසේම මෙම පිරිස් අතර ඇති වෙනස්කම් අවබෝධ කරගැනීමට ශ්‍රී ලංකා රජයද පැහැදිළි උත්සාහයක යෙදී ඇත. මෙම පිරිස් වල අභිමතාර්ථයන් අවබෝධකරගනිමින් ඔවුන් සමගින් ක්‍රියාකිරීමටද රජය පෙළෙඹී ඇත. එසේම රජය මෙම විදේශයන්හි වෙසෙන දමිළ ප්‍රජාව 'බිහිසුණු' පිරිසක් යැයි සිතා ඔවුන් හුදෙකලා කිරීමට කිසිදු ආකාරයකින් කටයුතු නොකරන අතරම ඉන් බොහෝ පිරිසකට කටයුතු කිරීමට සිදුවූයේ එල්ටීටීඊයේ තර්ජන මධ්‍යයේ බව අවබෝධකරගෙන සිටින බවද පැවසිය යුතුය. මෙම පිරිස් සමගින් සමබන්ධවී ශ්‍රී ලංකාවේ අභිවෘද්ධිය කෙරෙහි කටයුතු කිරීමට ශ්‍රී ලංකාව සූදනම්ය. මේ බව 2010 සැප්තැම්බර් මස 23 වන දින අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා එක්සත් ජාතීන්ගේ සමුළුව අමතමින් සිදුකළ ප්‍රකාශයෙන් පැහැදිළි වෙයි. එහිදී එතුමා පවසා සිටියේ විදේශයන්ගේ වෙසෙන දමිළ ප්‍රජාවගේ සුබසිද්ධිය වඩාත්ම ඉහළින් පතන්නේ ශ්‍රී ලංකාව බවයි. 'එන්න - අපගේ දෑත් ගෙන සැකය අවිශ්වාසය හැරද නව දිගයන්තකට පානගන්නැයි' ඔහු එහිදී මෙම පිරිස් වෙත ආරාධනා කළේය.

එසේම එල්ටීටීඊ සංවිධානය යුධමය වශයෙන් පරාජය කර ඇති නමුත් එම සටනට විදේශයන්හි සිට දිරිදුන් ශ්‍රී ලාංකික ප්‍රජාව ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානි කරන්නවුන්ට එරෙහිවීමේ සටන අවසානවී ඇතැයි නොසිතිය යුතුය. වර්තමානයේ සිදුව ඇත්තේ එම සටන හුදෙක්ම වෙනත් පෙරමුණක් වෙත ගමන් කිරීමක් පමණි. එම පෙරමුණ වනාහි මෙම ශ්‍රී ලාංකිකයන් පදිංචිව සිටින්නාවූ රාජ්‍යයන්මය. එම හේතුවෙන් ඔවුන්ට මේ සම්බන්ධයෙන් කළ හැකි කාර්ය බොහෝය. ප්‍රධාන වශයෙන් ඔවුනට තමන් වෙසෙන රාජ්‍යයේ තමන්ගේ සංවාදයන් සමගින් ශ්‍රී ලංකාවේ සැබෑ තත්ත්වය පිළිබඳව කරුණු දැනුම්දීමක් සිදු කළ හැකිය. එසේ සංවාදයක යෙදිය හැකි, ශ්‍රී ලංකාවට පැමිණ ශ්‍රී ලංකාවේ සැබෑ තත්ත්වය සම්බන්ධයෙන් ධනාත්මක තක්සේරුවක් ලබාගන්නා දමිළ ජාතිකයින් ගණන දිනෙන් දින ඉහළ යයි.

මෙම ප්‍රවණතාවය හමුවේ 'දමිළ ප්‍රජාව වෙනුවෙන් කථා කරන්නේ කවුරුන්ද?' යන පැනය සම්බන්ධයෙන් කෙටිකළකින්ම ඉක්මන් තිරණයකට එළෙඹීමට බටහිර රාජ්‍යයන්ට සිදුව ඇත. ඔවුන් සහයෝගය දක්වන්නේ ඊළමක් පතනාවූ සන්නද්ධ සුළුතර පිරිසක් වෙතද නැතහොත් සාමය අගයන සිය උපන් භූමියේ අභිවෘද්ධිය පතන මෙරට හා පිටරට වෙසෙන බහුතර දමිළ ප්‍රජාවක් වෙතද යන්න ඔවුන් තීරණය කළ යුතුව ඇත. ශ්‍රී ලංකාවේ ගැටුම් පැවති ප්‍රදේශයන්ගේ සිදුවන වේගවත් සමාජ ආර්ථික දියුණුව සමගින් සිදුවන සමගි සංධානය ඇතිවීම, මෙන්ම බලය බෙද දීම වැනි සිදුවීම් මෙම පැණයට නිසි පිළිතුරක් සපයනු ඇත.

**අනෙකුත් දැනුවත් මතවාදීන්**

මෙම පිරිස් සම්බන්ධයෙන් අප විශේෂයෙන් සැළකිල්ලක් දැක්විය යුත්තේ වර්තමානයේ ඔවුන් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ධනාත්මක කරුණු ලබාදෙන්නාක් සේම කරුණු ඍණාත්මක අතට හැරුණහොත් ඔවුන්ගේ අදහස්ද ඉතාමත් පහසුවෙන් ඍණාත්මක බවට හැරිය හැකි හෙයිනි. එහෙයින් මෙම පිරිස්වල වැදගත්කම අප අවතක්සේරු නොකළ යුතුය.

මේ සඳහා අප ආර්ථික නියාමන කටයුතු ශක්තිමත් කිරීම, ශ්‍රම වෙළෙඳපල ප්‍රතිසංස්කරණය කිරීම, රාජ්‍ය අංශය වඩාත් කාර්යක්ෂම හා වගකිවයුතු ආයතනයක් බවට පත් කිරීම, අපගේ අධ්‍යාපනික ක්‍රමවේදය නූතනයට ගැලපෙන පරිදි සකස් කිරීම ආදිය සිදු කළ යුතු අතරම පෞද්ගලික අංශය වඩාත් සමාජයීය වශයෙන් වගකිය යුතු අංශයක් බවටද පත් කළ යුතුය.

අප අයෝජන ලබාගැනීමට, සංචාරකයින් ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකාව නව වෙළෙඳපළ වෙත හඳුන්වා දීමට දැඩි වෙහෙසකින් යුතුව කටයුතු කරන අතරම අපට අවශ්‍යවන මානව ප්‍රාග්ධනය

සකස් කරගැනීමටද අප එවන් වෙහෙසක් ගත යුතුය. ඉන් අපට ශ්‍රී ලංකාවේ පිළිඹිඹුව ලෝකය පුරා ගෙනයාමට හැකිවනු ඇත.

රාජ්‍ය-පෞද්ගලික හවුල් ක්‍රියාකාරීත්වය වේගවත් ආර්ථික සංවර්ධනයක් සඳහා පමණක් නොව ශ්‍රී ලංකාව 'ප්‍රතිසන්නම්' ගත කිරීමටත්, ප්‍රතිවරණය කිරීමටත් අවශ්‍ය මූලෝපායික සහසම්බන්ධයක්ද වෙයි.

මහ බැංකු බෝම්බ ප්‍රහාරයෙන් පසු ශ්‍රී ලංකාවේ පැවති 1996 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය වෙත සහභාගිවීමට සමහරක් රාජ්‍යයන් පැකිලෙන පසුබිමක් තුළ ඒම අභියෝගයන් ඉක්මණින් ජයගෙන ස්ථාවරභාවකට පත්ව අප අපගේ ප්‍රවෘත්තිය ලොවට කියා පෑමේ සිද්ධිය මම මෙහිදී නැවතත් සිහිපත් කරමි. එනයින් ඉදිරියේ පැවැත්වීමට නියමිත ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලියත් ඉන් ශ්‍රී ලංකාවට ලැබෙන්නාවූ පුළුල් ප්‍රචාරයත් අප අපගේ අභිවෘද්ධිය සඳහා යොද ගත යුතුය.

කෙටියෙන් පවසතොත් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නැගෙන ඍණාත්මක කරුණු පරයා ධනාත්මක කරුණු වෙත අවධානය යොමු කිරීමට නම් අප ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සියලු පිරිස් සමගින්ම හරවත් සංවාදයක් ඇති කළ යුතුය.

**ජාත්‍යන්තර මාධ්‍ය**

තමා එක් කරගන්නා කරුණු සම්බන්ධයෙන් තමා එළෙඹෙන්නාවූ අගැයුම ජනමාධ්‍යවේදියෝ ජනතාව සමගින් බෙදහද ගනිති. මෙහිදී මම ජනමාධ්‍යවේදීන් වනාහි යම් මතවාදයක් සහිත පිරිසක් බවත් එම මතවාදයන් සමහර අවස්ථාවල අපගේ කැමැත්තට අනුරූප නොවන බවත් පිළිගනිමි. එනමුත් ඔවුන් කරුණු ඉදිරිපත් කිරීමේදී වඩාත් සමබර විය යුතු බවත්, පාඨකයින්ට තීරණවලට එළෙඹීමට ඉඩ ලබාදිය යුතු බවත් අවධාරණය කරනු කැමැත්තෙමි. මෙම මාධ්‍ය සහෝදරත්වයේ හිටපු සාමාජිකයෙකු වශයෙන් මගේ ආකල්පය වන්නේ වෘත්තීමය වගකීම් සීමාවට වඩා අවමයෙන් කටයුතු කිරීම මාධ්‍යවේදී වෘත්තීමය ගරුත්වයට හානි කරන්නාක්සේම, ඔවුන් නියෝජනය කරන්නාවූ ආයතනයන්හි විශ්වාසනීයත්වයටත්, සත්‍ය දැන ගැනීම සඳහා ඇති පාඨක අයිතියටත් නිගරු කිරීමක් වෙයි.

එසේම මාධ්‍ය සමගින් නිල සහ රාජ්‍ය මට්ටමින් වඩාත් සමීපව කටයුතු කිරීමද අත්‍යවශ්‍ය කරුණකි. මෙහිදී කොළඹ සිට ලෝකයට අමතන්නේ ජනමාධ්‍යවේදීන් අතලොස්සක් බවද ඔවුන් ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ගොඩනැගීමේ ප්‍රබල පුරුකක් බවද අප මතක තබා ගත යුතුය. එනමුත් මෙය මෙම අතලොස්සක්වූ ජනමාධ්‍යවේදීන් සියලුදෙනාම සිදුකරන්නාවූ කාර්යයක් නොවනබව අප යථාවාදී ලෙස පිළිගත යුතුය. යම් වැරදීම් සිදුවුවහොත් අප ඒවා සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තේ 'සියල්ලන්ම ඉවත හළ යුතුය' යන ආකල්පයෙන් නොවේ.

**ආ) අභ්‍යන්තර විසම්මතීන් වෙන් කිරීම**

විදේශයන්වල ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නිර්ණය කිරීම සම්බන්ධයෙන් පෙර සඳහන් කළ සෑම එක් එක් ප්‍රවර්ගයක්ම වැදගත් වන නමුදු ඒ සියල්ල තුළින්ම පැහැදිළි වෙනසක් ඇතිවේ යැයි සම්පූර්ණ විශ්වාසය තැබීම මනෝඥ නොවේ. එයට හේතු මේ සියල්ලක්ම අපට පරිබාහිරින්, අපගේ පාලන සීමාවට ඔබ්බෙන් ක්‍රියාත්මක වන බලවේග වීමයි.

ඒ හේතුවෙන් අප පළමුව අප දෙසටම අපගේ අවධානය යොමු කළ යුතුය. වෙනත් අයුරකින් කිවහොත් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය වෙත තිස්වසරක යුද්ධයෙන් සිදුවූ හානිය නැවතත් ප්‍රකෘතිමත් කිරීමට නම් අප පළමුවෙන්ම සිදුකළ යුත්තේ අප රටතුළ, අප අතර පවත්නා තරඟකාරී වෘතාන්තයන් සමතුලනය කිරීමයි.

1980 දශකයේදී එල්ටීටීඊය ප්‍රමුඛ දමිළ බෙදුම්වාදී පිරිස් ශ්‍රී ලංකාව අභ්‍යන්තරයේ තිබූ ගැටළුවක් බාහිර ලෝකයට ගෙනයාමට සමත්වූ බව අප සැමදෙනෙක්ම දන්නා කරුණකි. මේ සඳහා මොවුන් එම වකවානුවේදී පැවති කලාපීය හා ජාත්‍යන්තර තත්ත්වයන් මැනැවින් ප්‍රයෝජනයට ගත්හ. මේ හේතුවෙන් දැනට බාහිර ලෝකයේ විකෘති ස්වභාවක් දරණ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැවත යථාවත් කිරීමේ වගකීමට උර දිය යුත්තේ එක්සත්, සාමකාමී මෙන්ම සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් පතන්නාවූ ඔබ - අපයි. එම වගකීමෙන් අප කිසිවෙකුටත් නිදහස්විය නොහැකිය.

සෑම ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයකම සිදුවන පරිද්දෙන් ශ්‍රී ලංකාවේද අප අතර විවිධ මතවාදී වෙනස්කම් පවතින බව සත්‍යයකි. එනමුත් විදේශයන්හි ශ්‍රී ලංකාව හෙළා දැකීමේ තත්ත්වය ධනාත්මකව වෙනස් කර ගැනීමට අපට හැකිවන්නේ අප සියලුදෙනාම පොදු එකඟත්වයකට පැමිණ රටතුළ සිදුවන්නාවූ සිදුවීම් විදේශ ප්‍රතිපත්ති ගැටළු ලෙස හුවාදැක්වීම මගින් අයුතු වාසි ලබාගැනීමෙන් වැලකී සිටීමෙන් පමණි. අප ලෝකයේ අනෙකුත් රටවල් දෙස බැලීමේදී අප හා සමාන ගැටළුවලට මුහුණදී වර්තමානයේ ඒ ගැටළු සාර්ථකව විසඳාගැනීමට හැකිවූ පිරිස් එම ජයග්‍රහණ ලබාඇත්තේද මෙවැනි ක්‍රියාවලින් තම රට තුළ ක්‍රියාත්මක කිරීම හේතුවෙනි.

එසේ නොකිරීම වැරදි සහගත මෙන්ම දේශහිතෛශීවූවක් නොවන බවට නැගිය හැකි සදචාරාත්මක තර්කය අපි මොහොතකට පසෙකින් තබමු. මෑත අතීතය දෙස හැරී බැලීමේදී පැහැදිළිව අපට දැකිය හැකි කරුණක් වන්නේ ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාව දෝෂ දර්ශනයට ලක්වූ බොහෝ අවස්ථාවන් වලදී එසේ සිදුවීමට බලපෑ එක් ප්‍රමුඛ හේතුවක් වූයේ සියලුම දේශපාලනික බලවේග අවස්ථාවාදී ලෙස දේශාභ්‍යන්තරයේ පැවති ගැටළු ජාත්‍යන්තරකරණය කිරීම බවයි. එසේ ගැටළු ජාත්‍යන්තරකරණය කිරීමෙන් එය සිදුකළ පාර්ශ්වයන්ටද අත්වූ කිසිදු යහ ප්‍රතිඵලයක් නොමැති බවට ඉතිහාසය දෙස් දෙයි.

මේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැවත යථාවත් කිරීම සඳහා අප විසින් සිදුකළ යුතු ප්‍රධානතම කර්තව්‍ය ලෙස මා දකින්නේ අපට එකඟ විය නොහැකි කරුණු හඳුනාගෙන ඒවා එක් පසෙකට වෙන් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ බාහිර ප්‍රතිරූපයට හානිසිදුවීමට ඉඩ නොදීමයි. මෙසේ එකඟත්වයක් නොපවත්නා කරුණු සම්බන්ධයෙන් එකඟත්වයකට පැමිණීමට වඩාත් අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කළ යුතුය. මා මේ සඳහන් කළ ඉහළ පරමාර්ථයන් සඳහා මතබේදයට තුඩු දෙන ගැටළු පසෙකින් තැබීමේ ක්‍රියාවලිය සැබැවින්ම අප සියලුදෙනා නිරන්තයෙන්ම අපගේ එදිනෙදා ජීවිතයේදී, එනම් නිවසේදී, කාර්යාලවලදී මෙන්ම ප්‍රජාවන් වශයෙන්ද සිදුකරන්නාවූ කාර්‍යයකි.

**5. අවසානය**

මෙවන් මතවාදී වෘතාන්ත බොහොමයක් අතරින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ධනාත්මත වෘතාන්තයක් ගොඩනගා විදේශයන්හි පවත්නා ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නැවතත් ප්‍රතිවරණය කිරීම පහසු කාර්‍යයක් නොවේ. මා පළමුවෙන්ම මෙය අභියෝගයක් ලෙස හැඳින්වූයේද එබැවිනි. එනමුත් කර්නල් රාජපක්ෂ මහතා අපට ඉගැන්වූ පරිදි අභියෝගයන් ඇත්තේ ඒවාට මුහුණදී ඒවා ජයගැනීම සඳහාය.

කෙසේ නමුත් රටක් වශයෙන් අපහට සාර්ථකවීමට නම් එම කාර්‍ය රජය හෝ නිලධාරීන් හෝ පමණක් ඉටුකළ යුතු කාර්‍යයක් ලෙස සුළු කොට නොතැකිය යුතුය. එය අප සියලුදෙනාම හවුලේ ඉටුකළ යුතු වගකීමකි.

19 වන සියවසේදී කර්නල් ඕල්කට්තුමා ප්‍රමුඛ පරමවිඥාර්ථ සමාගමේ පිරිස ආනන්ද විද්‍යාලයය ඇතුළු බෞද්ධ අධ්‍යාපන ආයතන පිහිටුවීමේදී පැවති අභියෝගයන් අද දින අප මුහුණදෙන්නාවූ අභියෝගයන්ගෙන් වෙනස් වන්නේ මඳ වශයෙනි. එකළ පැවති අභියෝගය නම් යටත් විජිත පාලකයින් ශ්‍රී ලංකාව සිය ප්‍රතිපත්තිය වූ 'බෙද පාලනය කිරීම' හරහා ශ්‍රී ලංකාව සූරාකෑම වැලැක්වීමයි. මෙම පිරිස ශ්‍රී ලංකාව පුරා සංචාරය කරමින් රටෙහි ඒකීයභාවය, සදචාරාත්මක

ගුණවගාව, උසස් අධ්‍යාපනය මෙන්ම ස්වයංපෝෂිතභාවය ආදිය ලඟාකරගැනීම සඳහා ශ්‍රී ලාංකිකයින් දිරිගැන්වූහ.

මේ වකවානුවේදීද සැමදෙනා සැම දෙයක් සඳහාම එක්සේ එකඟවූයේ නැත. ඔවුන්ටද තමන් එකඟ නොවන්නාවූ කරුණු වෙන්කර හඳුනාගැනීමට සිදුවිය. එය සාර්ථකව කිරීම තුළින් ඔවුනට සියලුම ශ්‍රී ලාංකිකයන් පන්ති, කුල, ජාති, ආගම්, දේශපාලනික බේදයකින් තොරව ඒකරාශී කිරීමට හැකිවූ අතරම ඔවුහු සියලුදෙනා එක් පොදු අරමුණක්, එනම් ලෝකය ඉදිරියේ ජාතියේ ඒකාබද්ධතාවය සනිටුහන් කිරීමට එකා මෙන් පෙළ ගැසුනහ. මෙම පෙළගැස්මේ ප්‍රතිඵලය අප අධිරාජ්‍යවාදී බැම්මෙන් මිදීමයි.

අද දින, අප ආනන්ද විද්‍යාලයේ ආදි කර්තෘ කර්නල් ඕල්කට්තුමා සමරන මේ මොහොතේදී එද අපව 'බෙදපාලනය කිරීමේ' ක්‍රමය ක්‍රියාත්මක කළ බලවේගයන් හා සමානවූ නූතන බලවේගයන්ට අපගේ රටෙන් අයුතු ප්‍රයෝජන ගැනීමට ඉඩ නොහැරීමට අපි අදිටන් කර ගනිමු. අපගේ පෙර පියවරුන් මිට වසර 125කට පෙරදීද  සිදුකළාක් මෙන් අපගේ දෛවය අපගේ අවශ්‍ය පරිදි සකසා ගනිමු.

එවන් කාර්‍යයක නියැලෙන අප සැම ආනන්ද විද්‍යාලයේ ආදර්ශ පාඨය වන 'අප්පමාදෝ අමතපදං' (අප්‍රමාදව කටයුතු කරන්න)යන්න සිත්හි රඳවා තබා ගනිමු.

ඔබ සැමට ආනන්ද මෑණියන්ගේ සරණයි.